www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# වත්මන් ජනාධිපතිවරයා ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරනය ජයගැනීමත් සමග ම ආතතීන් උග්‍රවෙයි

**Tensions high as incumbent wins Sri Lankan presidential poll**

**කේ. රත්නායක විසිනි**

**2010 ජනවාරි 28**

අගහරුවාදා පැවති ජනාධිපතිවරනයේ ජයග්‍රාහකයා ලෙස වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂ නම් කිරීමත් සමග ම ශ්‍රී ලංකාවේ පවත්නා ආතති සහගත දේශපාලන තත්වය තව දුරටත් දිග් ගැස්සී ගියේය. විපක්ෂයේ අපේක්ෂක ජෙනරාල් සරත් ෆොන්සේකා රාජපක්ෂගේ ජයග්‍රහනයේ පරතරය විශාල වුවත් පරාජය භාරගැනීම ප්‍රතික්ෂේප කරමින් තමන් ප්‍රතිඵලය අභියෝගයට ලක් කරන බව නිවේදනය කලේය.

මෙම ප්‍රතිඵලය විකෘතකොට ඇතැයි වාර්තාකරුවන් අමතා ප්‍රකාශ කල ෆොන්සේකා එයට එරෙහිව නෛතික අභියෝගයක් ඉදිරිපත් කරන බව කීය. "ආන්ඩුව ජයග්‍රහනය අපෙන් පැහැරගෙන තිබේ. මෙහි ඇති ප්‍රජාතන්ත්‍රවාදයක් නැත." රාජපක්ෂ රාජ්‍ය දේපල අයථා ලෙස පරිහරනය කර තිබීම, තමාට පහර දීමට රාජ්‍ය මාධ්‍ය යොදාගෙන තිබීම සහ අවතැන් වූ දෙමල ජනයා ඡන්දය දීමෙන් වලක්වා තිබීම යන පදනම් මත ඡන්දය අවලංගු කරන්නයැයි ඉල්ලමින් ජෙනරාල්වරයා මැතිවරන කොමසාරිස්වරයාට ලියා ඇත.

ආන්ඩුව රාජ්‍ය යන්ත්‍රය අන්තයට ම පාවිච්චි කල බව ද රාජ්‍ය මාධ්‍යයන් තමන්ගේ ප්‍රචාරක උපකරනය ලෙස පාවිච්කල බව ද නිසැක ය. පෙර මැතිවරනයන්හි දී මෙන්ම, මෙවර ද ඡන්ද දිනයේ දී ප්‍රචන්ඩ ක්‍රියා මගින් බාධා සිදු කරන ලදී. මීට උතුරේ යාපනය නගරයේ බෝම්බ පිපිරීම් ද ඇතුලත් විය. මැතිවරන ප්‍රචාරන කාලය තුල ප්‍රචන්ඩ ක්‍රියා 900ක් පමන වාර්තා වී තිබේ. පසුගිය මැයි මාසයේ බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයේ (එල්ටීටීඊ) පරාජයෙන් පසු සිරකර තබන ලද දස දහස් ගනන් දෙමල සිවිල් වැසියෝ ඡන්දය දීමේ අයිතියට ද අහිමි කරනු ලැබූහ.

කෙසේවෙතත්, රාජපක්ෂට සියයට 58ක් ද ෆොන්සේකාට සියයට 40ක් ද වශයෙන් මිලියන දෙකක වැඩි ඡන්ද සංඛ්‍යාවක් සහිත මැතිවරන ප්‍රතිඵලය වෙනස් කිරීමට තරම් විශාල පරිමානයේ ඡන්දය මඩිගැසීමක් තහවුරු කරන වාර්තා මේ වනතෙක් ලැබී නැත. දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය සහ සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන ජෙනරාල් ෆොන්සේකා ප්‍රජාතාන්ත්‍රික විකල්පයක් යයි ඉදිරිපත් කල නමුත්, රටේ ප්‍රධාන ජෙනරාල්වරයාව සිටි ඔහු රාජපක්ෂට නොඅඩුව යුද අපරාධ වලට ද ප්‍රජාතන්ත්‍ර අයිතීන් දරුනු ලෙස පාගාදැමීමට ද වගකිව යුතු ය. ෆොන්සේකා රාජපක්ෂගෙන් කැඩී වෙන් වූයේ එල්ටීටීඊයේ පරාජයෙන් පසුව ඔහුව කොන් කිරීම නිසා පමනි.

දෙමල බහුතර ප්‍රදේශවල ප්‍රකාශිත ඡන්දයෙන් බහුතරය එල්ටීටීඊ සංවිධානයේ හොරනෑව වශයෙන් ක්‍රියාත්මක වූ දෙමල ජාතික සන්ධානයේ (ටීඑන්ඒ) ආධාරය ලද ජනරාල්වරයාට ලැබුන නමුත් එම ප්‍රදේශවල ඉතා අඩු ප්‍රමානයක් ඡන්දය ප්‍රකාශ වීම තුලින් පිලිබිඹු කෙරෙන්නේ අපේක්ෂකයන් දෙදෙනාම කෙරෙහි ජනයා තුල පවත්නා පිලිකුල සහ වෛරය යි. උතුරේ යාපනය දිස්ත්‍රික්කයේ ඡන්දය දුන්නේ ඡන්ද දායකයින්ගෙන් සියයට 26ක ප්‍රතිශතයක් පමනි. සිවිල් යුද්ධයේ අවසන් මාසවලදී විනාශ කරන ලද කිලිනොච්චි සහ මුලතිවු දිස්ත්‍රික්කවල ඡන්දය ප්‍රකාශ කිරීම යන්තම් සියයට 14ක් සහ සියයට 8ක් විය.

ජනගහනයෙන් වැඩි ප්‍රමානයක් අවතැන් වී සිටීම ද එයට හේතුවකි.

කෙසේ වෙතත්, සිංහල බහුතර ප්‍රදේශවල සැලකිය යුතු වැඩි ඡන්ද සංඛ්‍යාවක් රාජපක්ෂ දිනා ගත්තේ ය. එයිනුදු වඩාත් ගම්බද පෙදෙස්වල දෙදෙනා අතර පරතරය තවත් වැඩිවිය. මූලික වෙනසක් නැතිවූ ද එමෙන් ම විස්වාස කල නොහැකි පොරොන්දු දුන්නාවූ ද මේ දෙදෙනා අතරින් එක් අයෙකු තෝරා ගැනීමට සිදුවූ තතු තුල බොහෝ ඡන්ද දායකයෝ වත්මන් ජනාධිපතිවරයා දෙසට හැරුනාහ. රටේ ඡන්ද බල ප්‍රදේශවලින් 22න් 16ක බලය රාජපක්ෂ දිනා ගත්තේ ය. මෙම ප්‍රතිඵල, පසුගිය වසරේ එල්ටීටීඊයේ පරාජයෙන් අනතුරුව පැවත් වූ පලාත් සභා මැතිවරන මාලාවේ ප්‍රතිඵලයට සමාන්තර විය.

මැතිවරන ව්‍යායාමයේ පැවැති රුදුරුබව කොලඹ දේශපාලන සංස්ථාපිතය දෙදරවා ඇති ගැඹුරු භේද පිලිබිඹු කරයි. දශක ගනනාවක් රාජ්‍යය විසින් කරන ලද දෙමල විරෝධී වෙනස්කම් මගින් උග්‍රකරනු ලැබ අන්තිමේ දී වසර 26ක විනාශකාරී සිවිල් යුද්ධයක් ලෙස පුපුරා ගිය වාර්ගික බෙදීම් කිසිවක් හෝ එල්ටීටීඊය පරාජය කිරීමෙන් විසඳාලනු ලැබ නැත. එතෙකුදු නොව, යුද ගැටුම රටෙන් ඉමහත් ප්‍රමානයක් විනාශ භාග් කර දැමූ අතර දිවයිනේ උග්‍ර වන ආර්ථික අර්බුදය දෙගුන තෙගුන කලේය.

පාලක ප්‍රභූවේ බලගතු කන්ඩායම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නියමිත කප්පාදු බලෙන් පැටවීම සඳහා ද එයට එරෙහි ව පැන නගින කුමන දේශපාලන විරුද්ධත්වයක් හෝ මැඩලීම සඳහා ද හොඳම උපකරනය ලෙස ෆොන්සේකාට පිටුබලය සැපයූහ. එමෙන් ම කොලඹ දේශපාලනය ප්‍රධාන ජාත්‍යන්තර බලවතුන් අතර වැඩී එන ප්‍රතිමල්ලවතාවල පැටලී තිබේ. එක්සත් ජනපදය සහ යුරෝපය සමග පවත්වාගෙන ආ සුපුරුදු සම්බන්ධතාවයට හානි වන පරිදි රාජපක්ෂ පාලනය විසින් ලංකාව චීනයට උවමනාවට වඩා සමීප කරනු ලැබ ඇතැයි පාලක පන්තියේ කන්ඩායම් අතර සැලකිය යුතු විරුද්ධත්වයක් පැන නැගී ඇත.

මැතිවරනයෙන් පසු ආතතීන් සමනය වනවා වෙනුවට, උග්‍ර වී ඇත. ආන්ඩුව ඊයේ විරුද්ධ පාර්ශවය බියට පත් කිරීම අරමුනු කරගත් මෙහෙයුමක කොටසක් ලෙස ෆොන්සේකා, ඔහුගේ පවුල සහ ආධාරකරුවන් ලැගුම් ගෙන සිටි කොලඹ සිනමන් ලේක්සයිඩ් හෝටලය වටා සන්නාහ සන්නද්ධ හමුදාවන් සහ පොලිසිය යෙදවීය. යූඇන්පියේ රනිල් වික්‍රමසිංහ, ජවිපෙ අනුර කුමාර දිසානායක සහ ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයේ රාවුෆ් හකීම් ඇතුලු විපක්ෂ නායකයෝ එහි සිටියෝය.

හමුදා ප්‍රකාශක උදය නානායක්කාර මෙම වැටලීමට දැක්වූ සැකකටයුතු වූ හේතුව නම් හමුදාව හැරගියවුන් 400ක් හෝටලය තුලට රැස්ව සිටි නිසා "ආරක්ෂක වැඩපිලිවෙල" ක්‍රියාවට දැමූ බවයි. "ඔවුන් කාමර 100ක් වෙන් කරගෙන තියෙනවා. ඒ අය මැනවින් පුහුනු කල මිලිටරි පුද්ගලයන්. ඔවුන්ගේ එක්රැස් වීම පිලිබඳ අපට සැකයි", ඔහු ප්‍රකාශ කලේය. සොල්දාදුවෝ හෝටලයට ඇතුලු වන සහ පිට වෙන සෑම අයෙකු ම පරීක්ෂා කලහ. අහලපහල සියලු මාවත් අවහිර කලහ. නම් සඳහන් නොකල නිලධාරියෙකු "ඔහු [ෆොන්සේකා] කුමන්ත්‍රනයක පලවෙනි පියවර ගැනීමෙන් වැලැක්වීමට" මෙම වැඩපිලිවෙල අනුගමනය කල බැව් රොයිටර් සේවයට කීය.

හමුදාව හැරගිය කිසිවෙක් හෝ එහි සිටියේ නැතැයි කියා සිටි ෆොන්සේකා, ආන්ඩුව තමා අත් අඩංගුවට ගැනීමට සැරසෙතැයි චෝදනා කලේය. තමාගේ ආරක්ෂක සෙබලුන් හා වෙඩි නොවදින මෝටර් රථ භාර දීමට නියෝග කරමින් රාජපක්ෂ තම ජීවිතය අනතුරේ දමා තිබීම පිලිබඳව ද ඔහු රාජපක්ෂට චෝදනා කලේය. "මට මෙම හෝටලයේ දිගින් දිගටම රැඳී සිටීමට නොහැකියි. එය අධික වියදම් සහිත යැ"යි ඔහු කීවේය. "මෙය වනාහී මා ඝාතනය කිරීම ඉලක්ක කර ගත් ක්‍රියාවකි." ෆොන්සේකා අත් අඩංගුවට ගැනීමට සැලැස්මක් නැතැයි ආන්ඩුවේ නිලධාරිහු කීහ. පසුදින රාත්‍රියේ ඔහු හෝටලයෙන් පිටව ගියේය.

මෙම සිද්ධිය පෙර අගවන්නේ පිලිමල් දේශපාලන කඳවුරු දෙක අතර ඉවක්බවක් නැති සට්ටනයකට ඇදවැටී ඇති බවය. දේශපාලඥයින්, මාධ්‍යවේදීන් සහ දෙමල ජනයා සිය ගනනේ මරාදැමීමට රාජ්‍ය ගැති මිනීමරු මැර කල්ලි යොදාගැනීම ද ඇතුලු යුද්ධයක යෙදුනාවූ මෙම රාජපක්ෂ හා ෆොන්සේකා ජෝඩුව බලය ලබා ගැනීමට ද තබා ගැනීමට ද ඕනෑම ක්‍රමයක් යොදාගැනීමට සූදානම්ව සිටිති. ෆොන්සේකා සිටි හෝටලය වටලෑමට ගත් තීන්දුව පෙන්නුම් කරන්නේ, ෆොන්සේකා ද විපක්ෂයේ දේශපාලන පක්ෂ ද රාජපක්ෂ ඉවත් කිරීම සඳහා හමුදාව සහ රාජ්‍යයේ වෙනත් අවයව යොදාගනු ඇතැයි

ආන්ඩුවට පැවති ගැඹුරු සැකය ය.

තමා ප්‍රතිඵලයට අභියෝගය කිරීම සඳහා වීදි විරෝධතා කැඳවුම් කිරීමට බලාපොරොත්තු වන්නේ දැයි *ටෙලිග්‍රාප්* පුවත්පත ෆොන්සේකාගෙන් විමසූ විට, ඔහු මෙසේ පිලිතුරු දුන්නේය: "වහාම වීථිවලට පිවිසෙන ලෙස අප තවම ජනයා කැඳවා නැත. වැඩය සංවිධානය කල යුතු ය. මම ඔබ මවිත කරවන්නෙමි, ටිකක් ඉඳල බලන්නකො." ඔහු වැඩිදුර විස්තර කලේ නැත. අඩු වසයෙන් ටිකකලකට හෝ ජෙනරාල්වරාය ලංකාවෙන් පිටවනු ඇතැයි යම් ඇඟවීම් ද ඇත.

රාජපක්ෂ තන්ත්‍රයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ස්වාභාවය අවධාරනය කරන ජාත්‍යන්තර වාර්තාකරනයේ පැහැදිලි පක්ෂ භජනයක් දැකගත හැකිය. උදාහරනයක් ලෙස ඊයේ බ්‍රිතාන්‍යයේ *ටයිම්ස්* පුවත්පතේ පලවූ "බලය අපයෝජනය කිරීම ප්‍රජාතන්ත්‍රවාදය විගඩමක් බවට පත් කරයි" යන මාතෘකාවෙන් යුතු ලිපියක්, රාජ්‍ය මාධ්‍ය රාජපක්ෂ වෙනුවෙන් ගෙන ගිය නිර්ලජ්ජිත ප්‍රචාරක වැඩ පිලිවෙල උලුප්පා දක්වමින් රාජපක්ෂ "තමන්ගේ රටට බටහිර ප්‍රජාතන්ත්‍රවාදී සාරධර්ම අවශ්‍ය නැතැයි දීර්ඝ කලක් තිස්සේ තර්ක කල බව" සටහන් කලේය. එක්සත් ජනපදය සහ එහි යුරෝපීය මිතුරන්ට ලංකාවේ පවත්නා යුද්ධ මූලෝපායික ආසක්තයන් පෙන්නම් කල එය රාජපක්ෂ "චීනය, ඉරානය, ලිබියාව සහ බුරුමය සමග සබඳතා තහවුරු කර ගෙන ඇතයි" සටහන් කලේය.

මේ අතර *ෆයිනෑන්සියල් ටයිම්ස්* පුවත්පත ද එක්සත් ජනපදයේ වියදමෙන් ශ්‍රී ලංකාව තුල වැඩෙමින් පවත්නා චීනයේ බලපෑමට අවධානය යොමු කලේ ය. "යුද්ධය පැවති කාලයේ දී බෙයිජිනය ශ්‍රී ලංකාවේ වැදගත් සහකරුවෙකු විය: චීනය ලංකාවට ආයුධ සම්පාදනය කල අතර ආන්ඩුවේ යුද අපරාධ පරීක්ෂා කිරීමේ එක්සත් ජාතීන්ගේ යෝජනාවන්ට විරුද්ධ වී" යැයි එම පුවත්පත ලිවී ය. "චීනය ශ්‍රී ලංකාවට උපකාර කරන්නේ ඉන්දියන් සාගරයේ නාවික ගමනාගමන මාර්ගයෙහි මූලෝපායාත්මක ස්ථානයක ලංකාව පිහිටා තිබීම නිසායැයි විශ්ලේෂකයෝ අනුමාන කරති. ජනාධිපතිගේ ගම්පියස වන හම්බන්තොට ප්‍රදේශයේ වරායක් ඉදි කිරීමට බෙයිජිනය සහය දෙමින් සිටියි."

සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ එහි ජනාධිපතිවරන අපේක්ෂක විජේ ඩයස් ඊලඟ ආන්ඩුව දිවයිනේ ආර්ථික අර්බුදය විසඳගැනීම සඳහා කම්කරු පන්තියේ ජීවන කොන්දේසිවලට විෂකුරු ප්‍රහාරයක් ඉක්මනින්ම කඩාපාත් කරනු ඇතැයි ජනාධිපතිවරන උද්ඝෝෂනය තුලදී අනතුරු අඟවා සිටියහ. රාජපක්ෂ සහ ෆොන්සේකා අතර උග්‍රවන ගැටුම කම්කරු පන්තිය ඉදිරියේ ඇති අනතුර කිසිසේත්ම අඩු කරනු නැත. එම ගැටුම වනාහී පාලක පන්තිය පරදුවට තබා ඇත්තේ කුමක් ද යන්න ගැන තියුනු හැඟවුමකි. දේශපාලන කඳවුරු දෙකම කම්කරුවන් මත ආර්ථික අර්බුදයේ බර පැටවීමට අදිටන් කර ගෙන සිටිති.

කම්කරුවන්ට තම මූලික අයිතීන් සුරක්ෂිත කරගත හැක්කේ සමාජවාදී වැඩ පිලිවෙලක් ක්‍රියාවට දැමීමට කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ ආන්ඩුවක් සඳහා කරන අරගලයේ දී ධනපති පන්තියේ සියලුම කන්ඩායම්වලින් ස්වාධීනව සංවිධානය වීමෙන් පමනක්ම යයි සමාජවාදී සමානතා පක්ෂය එක්සත් සමාජවාදී පක්ෂය (යූඑස්පී) සහ නව සම සමාජ පක්ෂය (එන්එස්එස්පී) යන හිටපු වම්මුන්ට එරෙහිව අනතුරු අඟවා සිටියි. කොලඹ පාලන තන්ත්‍රයේ දේශපාලන අර්බුදය ගැඹුරුවෙත් ම එවන් අරගලයක අවශ්‍යතාව වඩාත් තදින් ග්‍රහනය කිරීම ඇරඹී ඇත.

සසප අපේක්ෂක විජේ ඩයස් කුඩා එහෙත් සැලකිය යුතු ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත්තේය. 4,197ක් වූ එය සසප 2005 ජනාධිපතිවරනයේ ලැබූ 3,500ට වැඩි සංඛ්‍යාවකි. රටේ මැතිවරන දිස්ත්‍රික්ක සියල්ලෙන් ම සහ ඒවා තුල මැතිවරන කොට්ඨාසවලින් බහුතරයකදීම සසපය ඡන්ද ලබා ඇත. සසප උතුරේ යාපනය දිස්ත්‍රික්කයේ ඡන්ද 621ක සංඛ්‍යාවක් ලැබීම අතිශය වැදගත් කාරනාවක් වන්නේ ය. එම ඡන්ද ලැබී ඇත්තේ දෙමල තරුනයන් සහ කම්කරුවන්ගෙන් සමන්විත වැදගත් ස්ථරයකිනි. වෘත්තීය සමිතිවල පාවාදීමට එරෙහි සම්මුති විරහිත විරුද්ධත්වය තුලින් වතුකරයේ කම්කරුවන් අතර අනුගාමිකත්වයක් දිනා සිටින සසප විශාල වතුයායවල්වලින් සමන්විත නුවරඑලිය දිස්ත්‍රික්කයේ දී 310ක ඡන්ද සංඛ්‍යාවක් දිනාගත්තේය.

මේ අතර, හිටපු රැඩිකලුන්ට ලැබුන සහාය තියුනු ලෙස කඩා වැටී ඇත. යූඇන්පියේ "නිදහසේ වේදිකාව" සමඟ අවස්ථාවාදී කල්ලි ගැසීමක් පවත්වා ගෙනගිය එක්සත් සමාජවාදී පක්ෂය (එසප) 2005 වසරේ ලැබූ 35,425ක ඡන්ද සංඛ්‍යාවේ සිට පහලට රූටා යමින් ඡන්ද 8,352ක් ලැබීය. 2005 වසරේ 9,296ක ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් නව සමසමාජ පක්ෂය

(නසසපය) මෙවර දක්ෂිනාංශික දෙමල ජාතික සන්ධානයේ (ටීඑන්ඒ) කැඩුනු එම්.කේ ශිවාජිලිංගම් සමග හවුලක් තනාගත් අතර ලබා ගත්තේ ඡන්ද 7,055කි. රාජපක්ෂ සහ ෆොන්සේකා කෙරෙහි දෙමල ජනයා තුල පවත්නා විරුද්ධත්වය ගසාකෑමට තැත් කල සිවාජිලිංගම් ලබා ගත්තේ ඡන්ද 9,662කි.

සසප තම සාර්ථකත්වය හෝ තම ඉදිරි දර්ශනයේ වලංගුතාව මැනගන්නේ, මෙම අවස්ථාවාදී ප්‍රවනතාවන් කරන්නාක් මෙන්, දිගහැරෙමින් පවත්නා දේශපාලන සන්තතිය පිලිබඳ විකෘති ප්‍රකාශනයක් වන නිල මැතිවරනයක දී ලද ඡන්ද සංඛ්‍යාව මගින් නොවේ. සසපට ලැබුන ඡන්ද සංඛ්‍යාව අඟවුම් කරන්නේ කම්කරුවන්ගේ හා තරුනයන්ගේ ස්ථරයන් අතර මෝදු වෙමින් පවත්නා සීමිත නමුත් නිශ්චිත රැඩිකලීකරනයකි. සසපට ඡන්දය දුන්නවුන් මත පැවරී ඇති අතිශය වැදගත් කර්තව්‍ය නම් අපගේ ක්‍රියාමර්ගය සහ ඉදිරි දර්ශනය අවධානයෙන් අධ්‍යයනය කොට පක්ෂයට බැඳී ඉදිරියේ එලඹීමට නියමිත පන්ති අරගල සඳහා අනිවාර්ය නායකත්වය ගොඩ නැගීමය.

© www.wsws.org